**රජයේ දැන්වීමයි**

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017 (නව/පැරණි නිර්දේශය)

## ප්‍රතිඵල නැවත සමීක්ෂණය

උක්ත විභාගයේ ප්‍රතිඵල 2018.03.28 දින නිකුත් කර ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද සෙ.මී. 30 x සෙ.මී. 20 ප්‍රමාණයේ **ඉල්ලුම්පත්‍ර පාසල් අයදුම්කරුවන් 2018.04.06 දින හෝ ඊට පෙර ලැබෙන සේත්, පෞද්ගලික අයදුම්කරුවන් 2018.04.12 දින හෝ ඊට පෙර** ලැබෙන සේත් **විභාග කොමසාරිස් ජනරාල්, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "**ප්‍රතිඵල නැවත සමීක්ෂණය - අ.පො.ස. (සා.පෙළ) විභාගය 2017 (නව/පැරණි නිර්දේශය)**" යන්න සඳහන් කළ යුතුය.

**ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ උත්තරපත්‍ර, නැවත සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු යටතේ සම්පූර්ණයෙන්ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ලකුණුවල හා ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.**

**ඉල්ලුම්පත් පිළියෙල කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.**

01. පාසල් අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර අදාළ විදුහල්පති මඟින් ද, පෞද්ගලික අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තමා විසින්ම ද ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. ඉල්ලුම්පත්‍ර ආදර්ශ ආකෘතිය අනුවම පිළියෙල කළ යුතුය.

03. එක් විෂයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබාගෙන **එය ඉල්ලුම්පත්‍රයෙහි පසුපිටෙහි නොගැලවෙන සේ හොඳින් අලවා එවිය යුතුය.** මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ අංකය ද, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අයදුම්කරු ළඟ තබාගත යුතුය. (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම වඩාත් යෝග්‍ය වේ.)

04. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

05. එක් විෂයකට එක් ඉල්ලුම්පත්‍රය බැගින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

06. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විෂය අංකය හා විෂයය, විභාග අංකය, විෂය නිර්දේශය, ලැබූ ශ්‍රේණිය, මාධ්‍යය සහ විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම නිවැරදිව ලිවිය යුතුය. උපදෙස් හොඳින් කියවා ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. **විශේෂයෙන් 01 (i) හි විෂය අංකය හා විෂයය ගැළපීම සහ 01 (ii) හි විභාග අංකය නිවැරදි විය යුතුය.**

07. **අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු සපයා ඇති හෝ නියමිත දිනට පසුව එවන හෝ අදාළ ගාස්තුව ගෙවා නොමැති හෝ ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි ඉල්ලුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

08. පෞද්ගලික අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍රයෙහි 01 සිට 06 දක්වා තොරතුරු පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.

09. මෙම දැන්වීම සහ ආදර්ශ ඉල්ලුම්පත්‍රය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ ද පළ කර ඇත.

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.
2018.03.

බී.සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

**සියලුම විදුහල්පතිවරුන් වෙත**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017 (නව/පැරණි නිර්දේශය)**
**ප්‍රතිඵල නැවත සමීක්ෂණය**

උක්ත විභාගයේ ඔබ පාසලට අයත් ප්‍රතිඵල ලේඛනය මේ සමඟ එවා ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද සෙ.මී. 30 x සෙ.මී. 20 ප්‍රමාණයේ **ඉල්ලුම්පත්‍ර 2018.04.06 දින හෝ ඊට පෙර** ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "**ප්‍රතිඵල නැවත සමීක්ෂණය - අ.පො.ස. (සා.පෙළ) විභාගය 2017 (නව/ පැරණි නිර්දේශය)**" යන්න සඳහන් කළ යුතුය.

**ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ උත්තරපත්‍ර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු යටතේ සම්පූර්ණයෙන්ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ලකුණුවල හා ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.**

**ඉල්ලුම්පත් පිළියෙල කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.**

01. ඉල්ලුම්පත්‍ර ආදර්ශ ආකෘතිය අනුවම පිළියෙල කළ යුතුය.

02. එක් විෂයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබාගෙන **එය ඉල්ලුම්පත්‍රයෙහි පසුපිටෙහි නොගැලවෙන සේ හොඳින් අලවා එවිය යුතුය.** (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම වඩාත් යෝග්‍ය වේ.)

03. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

04. එක් විෂයකට එක් ඉල්ලුම්පත්‍රය බැගින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

05. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විෂය අංකය හා විෂයය, විභාග අංකය, විෂය නිර්දේශය, ලැබූ ශ්‍රේණිය, මාධ්‍යය සහ විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම නිවැරදිව ලිවිය යුතුය. උපදෙස් හොඳින් කියවා ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. **විශේෂයෙන් 01 (i) හි විෂය අංකය හා විෂයය ගැළපීම සහ 01 (ii) හි විභාග අංකය නිවැරදි විය යුතුය. එම ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කර නිවැරදි බවට විදුහල්පති විසින් සහතික කළ යුතුය.**

06. විදුහල්පති සහතික කරන ලද **ඉල්ලුම්පත්‍ර සියල්ල නව නිර්දේශය හා පැරණි නිර්දේශය ලෙස වෙන වෙනම උපලේඛන ගතකර කවර දෙකක බහා** ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපිනයට එවිය යුතුය.

07. **අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු සපයා ඇති හෝ 2018.04.06 දිනට පසුව එවන හෝ අදාළ ගාස්තුව ගෙවා නොමැති හෝ ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි ඉල්ලුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

08. මෙම දැන්වීම සහ ආදර්ශ ඉල්ලුම්පත්‍රය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ ද පළ කර ඇත.

**සැ.යු. වැරදි තොරතුරු ඇතුළත් නැවත සමීක්ෂණ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් විභාග දෙපාර්තමේන්තුව මහත් අපහසුතාවයකට පත්වන බැවින් ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවට විදුහල්පති විසින් පෞද්ගලිකවම සෑහීමකට පත්වීමෙන් පසුව පමණක් අත්සන යොදා සහතික කළ යුතුය.**

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.
2018.03.